# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2096/57 – 2018 නොවැම්බර් 08 වැනි බ්‍රහස්පතින්දා – 2018.11.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

05 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මගේ යොමු අංකය 4-3/9/2016/ඩබ්ලිව්එස්/520.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය ජේ/ඩීඑස්/2/9/03/04 - 2016.

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජේ/80 ග්‍රෑන්ඩ් බසාර්, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වන්නාර්පන්නෙයි නිරිත (රෝහල) (කොට්ඨාස අංක 17, යාපනය මහානගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක වයිඒ/ජේඑෆ්එෆ්/2017/2 හා 2017.04.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0150 ක් පමණ වන වරි. අංකයන් නොමැති කන්නාතිඩ්ඩිකුලම් නැමැති ඉඩම් කොටසට මායිම්:

**1. කැබලි අක්ෂර 'ඒ' – වරි. අංකයක් නොමැති කන්නාතිඩ්ඩිකුලම් – ප්‍රමාණය: හෙක් 0.0150 ක් පමණ**

උතුරට, නැගෙනහිරට, දකුණට සහ බටහිරට: කන්නාතිඩ්ඩිකුලම්, යාපනය මහා නගර සභාව සතු දේපල.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය - 4-3/9/2017/ඩබ්ලිව්එස්/520.
2018 අගෝස්තු මස 27 වැනි දින
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 959